පේරාදෙණිය විශ්වවිද්‍යාලය
UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – 2014 (AUGUST 2015)
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2014 (අගෝස්තු 2015)

# SINHALA I (SLG I)
## ප්‍රබන්ධ කථා හා නාට්‍ය කලාව

**කාලය පැය තුන යි.**

සැම කොටසකින්ම එක් ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.
මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව (09) නවයකි.

---

### I කොටස

1. "**විරාගය** අධ්‍යයනය සඳහා, ප්‍රායෝගික නිර්ණායකයක් ලෙස යොදා ගත යුත්තේ බුදු සමය නො ව මනෝවිද්‍යාව ය." යන කියමන කෙතෙක් දුරට සහේතුක ද?

2. "යම් චරිතයකට ආවේණික චින්තන විධිය වටහා ගැනීම 'අන්තර් දෘෂ්ටිය' ලෙස මානව විද්‍යාවේදී හැඳින්වේ." මේ නිර්ණායකය අරවින්දගේ චරිතය විශ්ලේෂණය කිරීම සඳහා යොදා ගැනීම පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

3. "එමා බෝවාරි, මානසික අවපීඩනයෙන් පෙළුණු චරිතයකි. එනිසා ඇගේ චරිතාපදානය ප්‍රගතිශීලී කාන්තා චින්තනය පළදු කරයි." පක්ෂව හෝ විපක්ෂව සහේතුක පිළිතුරක් සපයන්න.

### I I කොටස

4. ආදරය හා ලිංගිකත්වය පිළිබඳව ඩී. එච්. ලෝරන්ස් ලියූ ලිපිවල පිළිබිඹු වන අදහස් කෙතෙක් දුරට **ජීවන සුවඳේ** කතා කෙරෙහි බලපා තිබේ ද?

5. "කාන්තාව ආකෘතිගත කිරීම" යන ලෝරන්ස්ගේ අදහසේ ඡායාව පතිත වූ **ජීවන සුවඳේ** එන කෙටිකතාවක් විභාග කරන්න.

6. "අපේක්ෂාභංගත්වය, අවසානයේ ආධ්‍යාත්මික සෞන්දර්යයක් බවට රූප විපර්යාස වීමේ ගුණයක් කචබත යසුනරිගේ කතාවල දක්නට ඇත." යන ප්‍රකාශය සමාලෝචනය කරන්න.

(අනෙක් පිට බලන්න)

## III කොටස

7. "සාම්ප්‍රදායික විවාහ ජීවිතයේ අඹු-සැමි ගැටුමේ කූටප්‍රාප්තිය **සෙල්ලම් ගෙය** තුළින් නිරූපණය වන අයුරු සාකච්ඡා කරන්න.

8. "**මැටි කරත්තය** කෘතියේ මූර්තිමත් වන ජන ජීවිතය, සැබෑ ඉන්දීය ජන ජීවිතය අනුගමනය නොකරන අතර එය කතුවරයාගේ නිර්මිතයකි." යන්නට ඔබ එකඟ වේ ද?

9. "මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රගේ **පෙමතො ජායතී සොකො** නාට්‍යයේ මූලික පුවත ථෙර ථෙරී ගාථා සම්භවය ලැබූ යුගයේ අත්දැකීමක රුව උසුලයි." විමසන්න.

(සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගිනි.)

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2014 (අගෝස්තු 2015)
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – 2014 (AUGUST 2015)

# SINHALA II ( SLG 2 )
( පැරණි ගද්‍ය සාහිත්‍යය භාෂාව හා ව්‍යාකරණය)

කාලය පැය තුනයි.

**පළමුවන** හා **නවවන** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

II, III කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරා ගත යුතු ය. මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව (09) නවයකි.

## I කොටස

1. (අ) පහත දැක්වෙන පාඨ තුන ලිහිල් බසින් ලියන්න.

(ලකුණු 10+8+7=25)

(ආ) ඉරි ඇඳි පද අතුරින් **පහකට (05)** විවරණ සපයන්න.

(ලකුණු 3×5 = 15)

i. සොර ක්ලාන්ත වි යැ. **මියෙහි** කෙළ සිඳී ගියෙ. ශරීරයෙන් ස්වෙද බස්සි. එ කලැ අඟුල්මල් සොර විස්මිත වැ "මම් පූර්වයෙහි දිවෙන ඇතුන් ලුහුබැඳැ ගනිම් මැ යැ. අසුන් ලුහුබැඳැ ගනිම් මැ යැ, රථ ලුහුබැඳැ ගනිම් මැ යැ. දිවෙන මුවන් ලුහුබැඳැ ගනිම් මැ යැ. එතෙකුදු හොත් මම් මෙ මහණහු පියෙවිගමනින් යන්නහු **බැල පමණින්** දිවෙනුයෙම් හඹා නො ගත හෙම් යි සිටැ බුදුනට "සිට මහණ." යි කී යැ. බුදුහු මම සිටියෙමි. තො ද සිට" යි වදළො. එ සඳැ අඟුල්මල් සොර "මේ සැ මහණහු සබවි කියති. මෙ මහණ යනුයෙ මැ 'මම සිටියෙමි. තො ද සිට'යි යෙයි. යම් කාරණයෙකින් මෙ මහණ යනුයෙ 'සිටියා' නම් වෙ ද, මම් සිටියෙම් 'නො සිටියා' නම් වෙම් ද, එ කාරණය පිළිවිසැ බැලුව මැනැවැ" යි සිතා "මහණ 'තො යන්නෙහි 'සිටියෙමි' යි යෙහි. මා සිටියා හට 'නො සිටියාහ' යෙයි. තො කිසෙ සිටියෙහි? මම් කිසෙ නො සිටියෙමි?" පිළිවිත්.

එ සඳ බුදුහු "අඞ්ගුලිමාලය, හිංසා සඳහා සතුන් කෙරෙ පැවැත්විය යුතු යම් දඬෙක් ඇද්ද, එ හැම කල්හි පියා ක්‍ෂාන්තිමෛත්‍රියැ සිටි වන බැවින් මම් 'සිටියා' නම් වෙමි. මෙතෙක් දහස් සතුන් මරන තා ක්ෂාන්තිමෛත්‍රියැ නොසිටි වන බැවින් තො 'නොසිටියා' නම් වෙහි. දැන් තො ඉරියවු විසින් සිටියෙහි ද, නිරයැ හො සිටිහි, **තිරිසන් යොනියැ** හො ප්‍රෙතවිෂයයෙහි හො අසුරකායයෙහි හො සිටිහි" යි වදළො.

(**අමාවතුර**: කෝදගොඩ ඤාණාලෝක සංස්: 134 - 135)

(අනෙක් පිට බලන්න.)

ii.

“වධක භාර්‍යාවෝ ය-චෞර භාර්‍යාවෝ ය-ස්වාමි භාර්‍යාවෝ ය මාතෘ භාර්‍යාවෝ ය-භගිනි භාර්‍යාවෝ ය-සඛී භාර්‍යාවෝ ය-දාසි භාර්‍යාවෝ ය යි ලෝකයෙහි පුරුෂයන්ට ස්ත්‍රීහු සත් දෙනෙක් වන්නාහ. ඔවුන් අතුරෙන් වධක භාර්‍යා නම් කවර යත්?

යම් ස්ත්‍රියක් ස්වාමීහු කෙරෙහි හැම වේලෙහිම දුෂ්ටවූ අදහස් ඇත්තී ද, සිතින් ප්‍රේමයක් නැති ව ව්‍යාජවාමය වූ ප්‍රේම හඟවන්නී ද, ස්වාමීහු කෙරෙහි ඇලුම් නැති ව පරපුරුෂයන් කෙරෙහි සක්තව ඇවිදිනීද, පරපුරුෂයන් ගරුකොට සිතන්නීද, ස්වාමිපුරුෂයා ලඝුකොට සිතන්නීද, ගලින් පැන් උනවාගත නො හැක්කා සේ පුරුෂයා දුඃඛිත වූ අවස්ථාවෙහි ඔහට බැරි බැරි වූ සම්පත් එලවන්නී ද, ස්වාමීහු දක්ක දී උස්පුටු ආදියෙහි ඉඳීමෙන් ආක්‍රොශපරිභව බිණීමෙන්අනාදර කරන්නීද, එසේවූ ස්ත්‍රී තොමෝ දිව්‍ය සමාන රූ ඇත්තී නමුත්, උතුම් වූ ජාති ඇත්තී නමුත්, අපමණ වූ දායාද සම්පත් හා දැසිදස් පරිවාර ජනයන් ඇත්තී නමුත්, ඕතොමෝ ඔහට භාර්‍යාවක් නො වන්නී ය, ඔහුගේ අකුසල් නමැති වධකයා ඔහට වධ පිණිස මවාලූ අන්දුබන්ධනයක් වැන්නීය, උරවකුමාලාවක් වැන්නීය, ඔහට හැම වේලෙහි ම අමෝරා ගෙන සිටිනා වධකා යුධයක් වැන්නී ය, කෙහෙලොමින් බැඳ සිරෝමුදුන් කළා වූ කඩු මුවහතක් වැන්නීය, මේ ආදි කාරණයෙන් ඕතොමෝ වධක භාර්‍යා නම් වන්නී ය යි දතයුතු. එයින් වදළහ:-

(පූජාවලියඃ කිරිඇල්ලේ ඥාණවිමල සංස්ඃ 700 පිටුව )

iii.

ඉක්බිති ඒ බැලී තොමෝ සාමණේරයන් වහන්සේ කෙරෙහි එදවස් උපදවන ලද්දා වූ චිත්තප්‍රසාදයෙන් එයින් මිය දඹදිව දෙවපුත්‍ර නම් නුවර රාජ්‍යය කරන රජ්ජුරුවන්ගේ අග මෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් මවු කුසින් බිහිවූය. එකල ක්‍රමයෙන් ඔවුන් ගේ ඉස කෙස් බහනා මඟුල් දිනය පැමිණි කල්හි ඒ කුමාරිකාවන් ගේ ඉසකෙස් කුණ්ඩලාකාරව නැමී අග්බඹුරුව තිබෙන හෙයින් මවුපිය දෙදෙන ඔවුන්ට “කුණ්ඩලී කුමාරිකා”යයි නම් තුබූහ. ඉක්බිති ඒ කුමාරිකාවන් පෙරඹමස සඳ සෙයින් ක්‍රමයෙන් වැඩී සොළොස් හැවිරිදි වයසට පැමිණි කල්හි යට කියන ලද තිස්ස නම් සාමණේරයන් වහන්සේ බුදුන්ගේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ වඳනා පිණිස මේ ලංකාද්වීපයෙන් නික්ම නැව් නැඟී දඹදිව වැඩ ගම් නියම් ගම් රාජධානි පිළිවෙළින් සැරිසරා දෙවපුත්‍ර නුවර සමීපයට පැමිණ “අඳනා සිවුර තුන්මඬුල්ල වසා වට සම කොට හැඳ කායබන්ධනය බැඳ සඟල හා පොරෝනය සඟුණ කොට සුපිළිසත්ව ගැටගත්වා පාත්‍රය අතින් ගෙන නුවරට වැද වියදඬු පමණකින් වඩා නො බලා බැලූවන්ට රිසියෙන තපො විලාසයෙන්” පිඬු පිණිස හැසිරෙන සේක් නුවර මහා වීථියට පැමිණි සේක.

(සද්ධර්මාලංකාරය : කිරිඇල්ලේ ඥාණවිමල සංස්ඃ 390 පිටුව )

(අනෙක් පිට බලන්න.)

## II කොටස

2. "**අමාවතුර** බුදුරදුන්ගේ ගුණ කියැවෙන අමාරස දහරක් වශයෙන් පමණක් නො ව, රමණීය බස්වහරකින් සිත්කලු වූ කෘතියක් වශයෙන් ද අගය කළ හැකි ය. මේ කියමන සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

3. "ගුරුළුගෝමීන්, **අමාවතුර** රචනා කිරීමේ දී, සංස්කෘත ගද්‍ය රීතියට වඩා පාලි රීතිය ගුරු කොට ගත්තේ, එය හදවතට වඩා බුද්ධියට අමතන සරල රීතියක් වන නිසාවෙනි" විමසන්න.

4. **සද්ධර්මාලංකාර** භාෂා රීතියේ සුවිශේෂතා පිළිබඳ සනිදර්ශන විමර්ශනයක යෙදෙන්න.

5. "ශ්‍රැති මාධූර්ය කතා රීතියෙන් රචිත **පූජාවලිය** පොදු ජනතාව දනට පිනට යොමු කරයි." මෙම අදහස පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

## III කොටස

6. "**සිදත් සඟරාව** තත්කාලීන පද්‍ය භාෂා ව්‍යවහාරයේ ව්‍යාකරණය යි." විචාරාත්මක ව විමසන්න.

7. **සිදත් සඟරාවේ** දැක්වෙන විසි වැදැරුම් වියරණ විදි අතුරින් ව්‍යාකරණ විග්‍රහයට අදාළ වියරණ විදි පිළිබඳ ව සාකච්ඡා කරන්න.

8. පහත දැක්වෙන මාතෘකා පාඨ **තුනකට (03)** විවරණ සපයන්න.

   i පියෙවි
   ii පෙරළි
   iii පසරුත්
   iv ලිඟු
   v සමස්

9. පහත දැක්වෙන වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කර ලියන්න.

   i මව හෝ පියා හෝ ගමට ගියහ.
   ii. පුතණුවෝ සදාදරණීය මැණියෝ සාතනය කළේ ය.
   iii. මල්ලී ද නංගී ද මම ද එහි ගියහ.
   iv. ඔවුහු කෙසේ හෝ විභාගයෙන් සමත් විය යුතු ය.
   v. මව විසින් දරුවන් රකිනු ලැබෙයි.
   vi. භාර්යාවෝ තම සැමියන් පැසසිය යුත්තෝ ය.
   vii. වතු හිමියන් මිනිස්සු ලවා ගස් කපවති.
   viii. සම්මන්ත්‍රණයට සහභාගි වූ දේශකයා සිසුහු සුව නින්දකට යොමු කළහ.
   ix. ටික දෙනෙක් පවෙහි නියැලෙයි.
   x. සිසුන් විශ්වවිද්‍යාලයට ඇවිත් නැත.

(2 සිට 9 දක්වා පිළිතුරුවලට උපරිමය ලකුණු 15 බැගිනි.)

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2014 (අගෝස්තු 2015)
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – 2014 (AUGUST 2015)

**SINHALA III ( SLG 3 )**
**(කාව්‍ය විචාරය, පැරණි පද්‍ය සාහිත්‍යය හා සාහිත්‍ය වංශය)**

**කාලය පැය තුනයි.**

**පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න. II, III කොටස්වලින් එක් ප්‍රශ්නයක් වත් තෝරාගත යුතු ය. නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.

මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව (08) අටකි.

## I කොටස

1. (අ) i. පහත දැක්වෙන පද්‍ය **ලිහිල් බසින්** ලියන්න.

පබවත කතෙවදන් වදන්මගැ හෙත යෝනත්
මිලී ගිය වත්හි විලස් මුහුලු පියුම්එ පැ මෙන්

පියවුරෙනුතුළ තෝ වළඟ පිරිමැදැ මඳ වත්
පබවත කත වන බියෙන් වහළෙව් යෙහෙළි විල්කල්

දැහැ යන තෙර පබවත ඉහි දළ රළ දැව ගත්
නොහොයි මෙන් වියෝ දුක් ගමනොත් යෙහෙළි විල්කල්

සරණතල පබවත වෙළලත සදත විල්කල්
තරඟතිනි වැලලා මෙන් බිමැ ඇපිළහී ගුගුරා

මේ යක් ලු මා හිමි පබවත් ලු ඔහු විඳිනී
නිසයුරු අඳුරු කො සමඟ ගොවළුයෙ කො හස් ඉස්බුම්

(**කව්සිළුමිණ**: ඇම්. බී. ආරියපාල සංස්: 527-531 ගී)

ii. **කව්සිළුමිණ** කතුවරයා සිය පරිකල්පන ශක්තියෙන්, අපූර්ව කාව්‍යෝක්ති නිපදවන අයුරු ඉහත පද්‍ය ද ඇසුරු කරමින් විමසන්න.

(අනෙක් පිට බලන්න)

(ආ) i. පහත දැක්වෙන පද්‍යවල අර්ථ **ලිහිල් බසින්** ලියන්න.

පා න නැඟී ගොස් වැද මුනි විමන් තො සේ
යා න සෙයින් යන පුරඳර පුරය දෙ සේ
පා න වෙමින් වැඳ වඩමින් කුසල් ර සේ
මා න ඔ යි න් යාගන් පින් පිඩක් ලෙ සේ

මු නි දියනා පෙර දිය නා කළ දූ ළිය
ඉ න් දිවනා තොස දිව නා පුද කෙළිය
ග ඟ බැසනා මඟ බැස නා දී ගි ළිය
තොද වී සිනා බල විසි නා මස් කෙළිය

(**මයූර සන්දේශය**: ඩබ්. ඈෆ්. ගුණවර්ධන සංස්: 42-43 පද්‍ය)

ii. **මයූර සන්දේශය** රසවත් කාව්‍යයක් වන්නේ කවියා විසින් උපයුක්ත කාව්‍යෝචිත ගුණයෙන් හෙබි අවස්ථාවෝචිත භාෂා රටාව නිසා ය." ඉහත පද්‍ය ද ඉවහල් කර ගනිමින් ඔබේ අදහස් දක්වන්න.

(ඇ) ii. පහත පද්‍යවල අර්ථය **ලිහිල් බසින්** ලියන්න.

මුල දුක් බික් දුකට
තද රිවි කිරණ ම ය බට
එ බැවින් ඒ මෙ විට
වැද්ද නොදෙමැ යි යනු සෙ දෙරණට

නිල් පැහැ කවද ගෙන
මහ ගිරි දුදුලු පැන ගෙන
මහ සෙන් මෙන් දිවන
වසා නුබ ගන අඳුරු කොට ගෙන

අප මුනිඳු වැඩි දෙස
නොතිබිය යුතු ය කුණු රස
දමවයි කියන ලෙස
පුරා ගෙන ගන ගොසින් දස දෙස

විදිනට යක් සෙනඟ
දෙවියන් රැගත් දුනු රඟ
ගත් නන් පැහැ තරඟ
සදා ඉඳුදුනු රැසින් සුර මඟ

අප හිමි මුනි පුදට
සිකි නළ රඟන රැඟුමට
හළ මලැඳිලි ලෙසට
සදා කොක වැල නැඟෙත අහසට

(**බුදු ගුණ අලංකාරය**: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සංස්: 552-556 පද්‍ය)

(අනෙක් පිට බලන්න.)

ii. සරල බස් වහරත් උචිත රිද්මයත් නිසා **බුදු ගුණ අලංකාරය** ආකර්ශනීය කාව්‍යයක් බවට පත් ව ඇති අයුරු උක්ත පද්‍යයන් ද ආශ්‍රය කරගනිමින් පෙන්වා දෙන්න.

(පළමුවන ප්‍රශ්නයට උපරිමය ලකුණු 40යි)

## II කොටස

2. "නිදහස් ව ගලා ආ සිංහල කාව්‍ය සම්ප්‍රදායය, **සියබස්ලකර** රචනාවීමත් සමඟ ම කිසියම් රාමුවක සිර ගත විය." මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

3. සංස්කෘත කාව්‍ය විචාර සංකල්ප සියල්ලට ම අදාළ සිද්ධාන්තයක් ලෙස 'ඖචිත්‍යය' සැලකිය හැකිදැ'යි විමර්ශනය කරන්න.

4. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකකට** කෙටි සටහන් සපයන්න.

   i. කාව්‍ය දෝෂ
   ii. නව නළු රස
   iii. ගෞඩී හා වෛදර්භී රීති
   iv. කාව්‍යමය ධ්වනිය
   v. 'රසවත් වැකිය කවිය වේ'

## III කොටස

5. "මූලාශ්‍රයවලට පිටින් යමින්, **කව්සිළුමිණ** කතුවරයා පබවතගේ චරිතය නිරූපණය කරන්නේ, පාඨක අනුකම්පාවට බඳුන් වන කුමරියක ලෙස ය." සනිදර්ශන ව පෙන්වා දෙන්න.

6. ස්වභාව සෞන්දර්ය වර්ණනයෙහි ලා **මයූර සන්දේශ** කවියා දක්වන සාමර්ථ්‍යය නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

7. **බුදු ගුණ අලංකාර** කතුවරයා හාස්‍ය රසය හා උපහාසය අති සියුම් ලෙස උපයෝගී කරගත් අයුරු අදාළ නිදසුන් මගින් පෙන්වා දෙන්න.

8. සම්භාව්‍ය කාව්‍ය සම්ප්‍රදායය සහ ජනකවිය අතර එකමුතුවක් කෝට්ටේ යුගයෙහි රචිත කාව්‍යයන්ගෙන් අනාවරණය වන්නේදැ'යි විමසන්න.

(2 සිට 8 දක්වා පිළිතුරුවලට උපරිමය ලකුණු 20 බැගිනි.)